# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,822—1931ක්වූ ජනවාරි මස 3 වෙනි දිනවූ සෙනසුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාඞ්ග නීති. U 304/30

කෑගල්ලේ සව්සව්‍යාහිවෘඞ් සභාව විසින් 1898වේ ලෝකල් බෝඩ්සහා ආඥාපණතේ 56 වන වගන්තිය යටතේ සාදන ලදුව කාරක මන්ත්‍රිසභාවේ අනුශාසනය ඇතුව ආණ්ඩුකාරයාණන්වහන්සේ විසින් 57 වන වගන්තිය යටතේ අනුදන්නාලද උප නීති.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

බී. එච්. බූර්ඩිලොන්,
මහ ලේකම් වම්හ.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 22දින කොළඹ
මහ ලේකම්තැනගේ කන්තෝරුවේදීය.

### C.—භෝජනශාලා හා තේ කෝපිකඩ.

1. සියලුම භෝජනශාලා හා තේ කෝපිකඩ සභාපතිතැන සෑහේයයි පිළිගන්නා ප්‍රමාණයට සනීපය ආරක්ෂාවන්සේ තැබිය යුතුයි.

2. යම්කිසි භෝජනශාලාවකට හෝ තේ කෝපි කඩයකට අයිතිවූ හෝ එහි පාවිච්චියට ගනුලබන භාජන, බඩුබාහිරාදිය සහ අනිකුත් උවමනා ද්‍රව්‍ය නිරන්තරයෙන්ම පිරිසිදුව තැබිය යුතුයි. තේ කෝපි කඩවල පාවිච්චියට ගන්නා මේසවල උඩ පැත්ත සින්ක් තහඩුවලින් වසා තිබිය යුතුයි.

3. සියලුම භෝජනශාලාවල සහ තේ කෝපි කඩවල සියලුම බිත්ති හුනුපිරියම්කොට සුදුහුනු ගෑයුතුයි. කාමර හොඳින් වාතය හා ආලෝකය ලැබෙනසේ තිබිය යුතුයි. ශෞචිම සිමෙන්තියෙන් පිරියම්කළ යුතුයි.

4. යම්කිසි භෝජනශාලාවක් හෝ තේ කෝපි කඩයක් පිහිටි ස්ථානයේ හෝ ඒ අවට තිබෙන සියලුම කුනුකසල දවසකට දෙවරක් බැගින් ඉවත ගෙනගොස් දැමිය යුතුයි.

5. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ භෝජනශාලාවක් හෝ තේ කෝපි කඩයක් භාරව සිටින්නාවූ තැනැත්තකු දුනුවත්ව මෑතදී පෙළී සිටියාවූ හෝ එවැනි රෝගයකින් පෙළෙන අයකුට මෑතදී සාත්තුකිරීමෙහි යෙදී සිටියාවූ කෙනකුට එබඳු භෝජනශාලාවේ හෝ තේ කෝපිකඩේ භාරව සිටින අයකු විසින් එබඳු යම් භෝජනශාලාවක හෝ තේ කෝපි කඩයක හෝ ඒ අවට වැඩෙහි යෙදෙන්නට ඉඩ නොදිය යුතුයි.

6. භෝජනශාලාවක හෝ තේ කෝපි කඩයක ප්‍රයෝජනයට ගන්නා සීනි, වීදුරු මූඩි යොදාලද කට පළල් බෝතලවල දමා තැබිය යුතුයි.

7. විකිණීමට තබනලද සියලුම රසකැවිලි ආදිය නිසිලෙස සාදනලද මැස්සන් ඇතුල්විය නොහැකි වීදුරු පෙට්ටිවල දමා තැබිය යුතුයි. කිසිම ආහාර ද්‍රව්‍යයක් මැස්සන්ට ඇතුල්විය නොහැකි භාජනවල හැර නොතැබිය යුතුයි. ප්‍රයෝජනයට ගන්නා වීදුරු පෙට්ටි හොඳින්ම පිරිසිදුව තැබිය යුතුයි.

8. අහක යන තේ, කෝපිරොඩු හෝ අහකදමන කිරි හෝ කෑම ඉඳුල් හෝ පිසීමේදී අහක යන ද්‍රව්‍ය ඒවා නිසි භාජනයක එකතුකොට දිනපතාම ඉවත්කළ යුතුයි. ඒවා බිම විසි නොකළ යුතුයි.

9. කිසිම භෝජනශාලාවක් හෝ තේ කෝපිකඩයක් පිහිටි ස්ථානයක කවලම් කිරි විකිණීම හෝ මිළයට ගන්නට සිටීම හෝ විකිණීමට තැබීම හෝ එහි තබාගැනීම යුතුනොවේ. මේ උප නීතිය සම්බන්ධව කවලම් කිරි යන්නෙන් හඟවන්නේ එහි ප්‍රමාණය වැඩිකිරීම හෝ ඝනත්වය තිබෙනවාට වඩා හොඳසේ පෙන්වීම පිණිස වතුර හෝ වෙනයම් පිටස්තර ජලයක් හෝ මිශ්‍රකරනලද කිරිවේ.

10. මේ උපනීති රාමුවක දමා සෑම භෝජනශාලාවේ හෝ තේ කෝපි කඩේ හොඳින් පෙනෙන ස්ථානයක එල්ලා තැබිය යුතුයි.

11. මෙහි ඉහත සඳහන්වන නීතිවලින් යමක් කඩකිරීම හෝ හරියාකාර පිළිනොපැදීම ගැන සෑම භෝජනශාලාව, හෝ තේ කෝපි කඩය අයිතිකාරයා හෝ එය බාරකාරයා, වගකිය යුතුය.

### D.—ගාල්.

1. අවසරලත් සෑම ගාලම සභාපතිතැන විසින් ලියාපදිංචි කළ යුතුය. "නොම්මර......ලියාපදිංචිකරනලද ගාල" යන වචන සහ අයිතිකාරයාගේ නම පින්තාරුකරනලද දැන්වීම් ලෑල්ලක් අවසරලත් තැනැත්තා විසින් එවැනි සෑම ගාලට ඇතුල්වන දොරටුවේ එල්ලා තැබිය යුතුයි.

2. සෑම හරක්ගාල සභාපතිතැන සෑහේය කියා පිළිගන්නා අන්දමට සමකොට කානු දමා තිබිය යුතුයි. බිම තදව සමව තිබෙනසේ ගලින් බැඳ හෝ ගල්කැලි දමා හොඳකාර තද කොට තැබිය යුතුයි. එවැනි ගව ගාලේ තිබෙන සියලුම ගොඩනැගිලි 3වෙනි උප නීතියට එකඟවනසේ සාදා පවත්වා ගතයුතුයි. එවැනි ගාල දිනපතා හොඳකාර පවිත්‍රකොට සියලුම ගොම සහ කුනුකසල මිනිසුන් වාසයකරන ගෙවලින්

16. පරීක්ෂක මූලාදෑනීන් කිරිපට්ටිය බලන්නට ආවිටක ඔවුන්ගේ රපෝර්තු ලිවීම පිණිස කිරිපට්ටියකට අවසරලත් සෑම අයම ඔහුගේ කිරි කාමරයේ රපෝර්තු පොතක් තැබිය යුතුයි.

17. ලෝකල් බෝඩ් සභාවේ සභාපතිතැනට සනීපාරක්ෂක වෛද්‍ය මූලාදෑනිතැනට, ලෝකල් බෝඩ් සභාවෙන් පත්කරන ලද ලේකම්තැනට හෝ පරීක්ෂකතැනට යම් අවසරලත් කිරිපට්ටියකින් හෝ කිරි වෙළඳාම්කරන්නාවූ හෝ විකිණීමට තබා සිටින්නාවූ කෙනකුගෙන් පරීක්ෂාකිරීම පිණිස කිරි ටිකක් ගැනීමට සෑමකල්හිම බලය තිබේ.

18. ලෝකල් බෝඩ් නගර සීමාතුළ පිහිටි සෑම කිරිපට්ටියම සභාපතිතැන විසින් ලියාපදිංචිකොට එක් එක් ඉල්ලුම්කාරයාට ලියාපදිංචිකළ බවට ඔහුගේ නම සහ නොම්මරයත් දරන පත්‍රයක් දෙනුලැබේ. මේ පත්‍ර ලෝකල් බෝඩ් සභාවේ බලයලත් යම් මූලාදෑනියකු විසින් හෝ සනීපාරක්ෂක පරීක්ෂකයකු විසින් බලන්නට ඉල්ලූවිටක පෙන්විය යුතුයි.

19. මෙම උපනීතිවලින් පිටපතක් සෑම කිරිපට්ටියේම කිරි කාමරයේ එල්ලා තැබිය යුතුයි.

20. මෙහි ඉහත සඳහන් උපනීති අතුරෙන් යම් කිසිවක් කඩකිරීම හෝ නොපිළිපැදීම ගැන කිරිපට්ටියට බලයලත් අය වගකිය යුතුයි.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීමයි.

ශ්‍රේෂ්ඨාධිකරණ මන්ත්‍රණසභාවේ සම්මතය ඇතුව වර්ෂ 1911යේ 10වෙනි ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876යේ 3වෙනි ආඥාපණතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකරණ ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත දක්වන ඉඩම් ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා :— එනම් පාරක් සෑදීම (කොල්ලුපිටියේ යුග්මපාර) පිණිස අයිතිකරගැනීමට අණකරණලදී.

ප්‍රාරම්භ පැලෑන නො. 20,069. ගම—බම්බලපිටිය.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියාසිටින අයගේ නම. | විසාලකම්. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වජිරපාරේ වරිපනම් නො. 24 දරණ ඉඩමේ කොටසක් | හුණුනත්බැඳ උළුසෙවිලිකළ ගොඩනැගිලි 3ක කොටස්ද, ඒට යාකළ හුණුනත්බැඳ උළුසෙවිලිකළ ලී සහ තහඩු සහ හුණුනත්බැඳ උළුසෙවිලිකළ කොටස්ද, හුණුනත්බැඳි තහඩුගැසූ ස්තෝප්පුවක්ද, තහඩු කොටසක්ඇති හුණුනත්බැඳි උළුසෙවිලිකළ වැසිකිළියක්ද, හුණුනත්බැඳි පඩිපෙලක්ද, හුණුනත් බැඳි කානු සහ කානුවක කොටසක්ද, හුණුනත් බැඳි කාප්ප කොටසක්ද, හුණුනත්බැඳි බාල්දියක් සහ වතුර පයිප්පයක්ද, සෝදිසිවලක්ද, අවුරුදු 40ක් වයසැති පොල්ගස් 6ක්ද, අවුරුදු 25ක් වයසැති පොල්ගස් 3ක්ද, අවුරුදු 5ක් වයසැති පොල්ගස් 3ක්ද, අවුරුදු 20ක් වයසැති කොස්ගහක්ද, අවුරුදු 5ක් වයසැති පුවක්ගස් 3ක්ද ඇති වත්ත | දෙස්තර අයි. ඊ. මෙයියර් මහත්මයා | 0 0 24 |
| 2 | එම .. | හුණුනත් බැඳ උළු සෙවිලිකල ගොඩනැගිලි 2ක කොටස්, ඒට යාකළ තහඩු සහ හුණුනත් බැඳි කොටසක්ද, හුණුනත් බැඳි කාප්ප කොටසක්ද, හුණුනත් බැඳි කානුවක කොටසක්ද, අවුරුදු 40ක් වයසැති පොල්ගහක්ද, අවුරුදු 25ක් වයසැති පොල්ගහක්ද, අවුරුදු 5ක් වයසැති පොල්ගහක්ද, අවුරුදු 20ක් වයසැති කොස්ගහක්ද ඇති වත්ත | එම .. | 0 0 6·05 |
| 3 | එම .. | හුණුනත් බැඳ උළු සෙවිලිකළ ගොඩනැගිල්ලක කොටසක්ද, ඒට යාකල හුණුනත් බැඳ උළු සෙවිලිකළ ලී සහ තහඩු සහ හුණුනත් බැඳ උළු සෙවිලිකළ කොටසක්ද, හුණුනත් බැඳි පඩිපෙලක්ද, අවුරුදු 25ක් වයසැති පොල්ගස් 3ක්ද, අවුරුදු 2ක් වයසැති පොල්ගහක්ද, අවුරුදු 20ක් වයසැති කොස්ගහක්ද ඇති වත්ත | එම .. | 0 0 13·16 |
| | | | | 0 1 3·21 |

එකී ආඥාපණතේ 7වෙනි වගන්තියේ ප්‍රකාර යුතු අන්දමින් අයිතිකරගැනීමට අදහස්කරණ බැව් ප්‍රසිද්ධයේ මෙයින් දැනුම්දෙමි.

ඒ නිසා එකී ඉඩම් ගැන සැලකීමක් ඇති සියලුදෙනාම ඔවුන්ගේ අයිතිවාසිකමේ අන්දමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වට්නාකමද, ඒව අයත් තවත් තොරතුරුද කියා සිටින පිණිස වර්ෂ 1931ක්වූ පෙබරවාරි මස 2වෙනි සඳුදින පෙරවරු 10යට තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය ඉඩම්වල ඔප්පුද, රිජිස්ටර් පොතේ කොපියක්ද රැගෙණ කොළඹ නාගරික සභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1930ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින
කොළඹ නාගරිකසභා කන්තෝරුවේදීය.

එච්. ඊ. නියුන්හැම්,
නාගරික සභාවේ සභාපතිතැන සහ නාගරාධිපතිතුමා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.